සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01 වී වගාවට හානිකරන කෘමීන් විනාශ කිරීම සඳහා ............................................ මිනිසාට උදව් කරයි. (ඇටිකුකුළා / බත්කුරා / කපුටා)

02 පාසල් වත්තේ හැඩය හඳුනාගැනීමට .................................... ප්‍රයෝජනවත් වේ. (ගේට්ටුව / බැම්ම / මායිම)

03 පාසලක අනන්‍යතාවය ප්‍රකාශ කිරීමේදී අධ්‍යාපන කලාපයට පසුව ........................................................ යොදනු ලැබේ. (දිස්ත්‍රික්කය / අධ්‍යාපන කොට්ඨාසය / අධ්‍යාපන කාර්යාලය)

04 ගෘහ ආශ්‍රිතව සිදුකරනු ලබන කර්මාන්ත ............................................................ ගණයට අයත්ය. (මහා පරිමාණ කර්මාන්ත / කුඩා පරිමාණ කර්මාන්ත / මධ්‍ය පරිමාණ කර්මාන්ත)

05 උතුරු මැද පළාතට අනුරාධපුරය හා ................................................................... දිස්ත්‍රික්කය අයත් වේ. (මාතලේ / වව්නියාව / පොළොන්නරුව)

- **අං 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 චිත්‍රයට වඩා සිතියමකින් භූගෝලීය ලක්ෂණවල පිහිටීම, දුර ප්‍රමාණය හා හැඩය නිශ්චිතව දැක්විය හැක. ( )

07 වවුලා ඵල හටගැනීමට අවශ්‍ය පරාගනය සිදුකරන සතෙකි. ( )

08 ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය පළාත වේ. ( )

09 බස්නාහිර දිශාව හා උතුරු දිශාව අතර වයඹ දිශාව පිහිටා ඇත. ( )

10 ශ්‍රී ලංකාවේ කඳුකර කලාපයේ වගා කරන ප්‍රධාන භෝගයක් ලෙස බීට්රූට් වගාව දැක්විය හැකිය. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 වර්ෂාව ඇතිවීමට පෙර අහසේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය මින් කුමක් ද?

(1) නිල් පැහැති වලාකුළු දක්නට ලැබීම. (2) ලා පැහැති දිගටි වලාකුළු ලැබීම.

(3) අඳුරු පැහැති ඝන වලාකුළු දක්නට ඇත. (4) වලාකුළු දක්නට නොලැබීම.

12 හිරු උදාවන දිශාවට මුහුණලා දෑත දෙපසට දිගුකර සිටගත්විට ඔබේ දකුණු අත විහිදෙන දිශාවෙන් පෙන්නුම් කරන දිශාව වන්නේ,

(1) උතුරු දිශාවයි. (2) දකුණු දිශාවයි.

(3) නැගෙනහිර දිශාවයි. (4) බටහිර දිශාවයි.

13 නුවරඑළිය දිස්ත්‍රික්කයේ වර්ෂාපතනය 100mm වන අතර උෂ්ණත්වය 12ºC කි. මෙහි 100mm ක වර්ෂාපතන අගය මැනීමට භාවිත කරන උපකරණය කුමක් ද?

(1) උෂ්ණත්වමානය (2) අනිලමානය

(3) වර්ෂාමානය (4) සුළං දිශා දර්ශකය

14 පහත සඳහන් භූගෝලීය ලක්ෂණ අතුරින් මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණය කුමක්දැයි තෝරන්න.

(1) උස්බිම් (2) උද්‍යාන (3) වනාන්තර (4) පහත් බිම්

15 ශ්‍රී ලංකාවේ ගංගා නිම්න ප්‍රදේශවල බහුලව වගාකරන බෝගය මින් කුමක් ද?

(1) තේ (2) රබර් (3) පොල් (4) වී

- **අංක 16 සිට 20 දක්වා සඳහා A තීරුවේ ඇති ප්‍රශ්නවලට ගැලපෙන ප්‍රකාශය B තීරුවෙන් තෝරා ඊට හිමි පිළිතුර තිත් ඉරමත ලියන්න.**

| | A තීරුව | | B තීරුව |
|---|---|---|---|
| 16 | ශාක වර්ධනයට අවශ්‍ය වායුව | (...................) | 1. මිලි මීටර් |
| | | | 2. ගිරවා |
| 17 | කුරුණෑගල දිස්ත්‍රික්කයට මායිම් වේ. | (...................) | 3. නයිට්‍රජන් |
| | | | 4. කපුටා |
| 18 | වර්ෂාපතනය මනින ඒකකය | (...................) | 5. සුළං දිශා දර්ශකය |
| | | | 6. ගම්පහ |
| 19 | පරිසරය පිරිසිදු කිරීමට උදව් කරන පක්ෂියෙකි. | (...................) | 7. කොළඹ |
| 20 | සුළඟ හමන දිශාව දැනගැනීමට උපකාරී වේ. | (...................) | 8. අනිල මානය |

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01 පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.


(i) ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුහුදු සීමාවට මායිම් වන I හා J අක්ෂරවලින් දැක්වෙන දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් නම් කරන්න. (ල.04)

(ii) ශ්‍රී ලංකාවේ කුඩාම දිස්ත්‍රික්කයට හිමි අක්ෂරය දක්වා එම දිස්ත්‍රික්කය අයත් පළාත ලියන්න. (ල.04)

(iii) ශ්‍රී ලංකාවේ දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක අතුරින් G හා K අක්ෂර හිමි දිස්ත්‍රික්ක දෙක නම් කරන්න. (ල.04)

(iv) ඔබේ පාසල පිහිටි දිස්ත්‍රික්කයට අයත් අක්ෂරය ලියන්න. (ල.02)

(v) ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයකට හිමිකම් කියන පළාත ලියා දක්වන්න. (ල.02)




02 (i) සපයා ඇති තොරතුරුවලට අනුව පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. (ල. 07)

<u>පහළට</u>

(1) කාලගුණික අංගයකි.

(3) සුළඟේ වේගය මැනීමට භාවිතකරන උපකරණයයි.

<u>හරහට</u>


(2) මාලිමා යන්ත්‍රය උපයෝගී කරගෙන හඳුනාගත හැකි දිශාවයි.

(4) මේ තුළින් වළාකුළුවල ස්වභාවය හඳුනාගත හැක.

(5) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන වර්ගයයි.

(6) මිනිසාට හානි ගෙනදෙන විෂ සහිත උරගයෙකි.


(7) ශ්‍රී ලංකාවේ වී වගා කරන කන්නයකි.




(ii) හිස්තැනට ගැලපෙන වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි. විශාල (1) .................................. ග්‍රාම නිලධාරී කොට්ඨාස කිහිපයක් තිබීමට පුළුවන. ග්‍රාම නිලධාරී කොට්ඨාසයට නමක් හා (2) .................................................. තිබේ. ග්‍රාම නිලධාරී කොට්ඨාස කිහිපයක් එකතුවීමෙන් (3) .................................. කොට්ඨාසය ද, එම කොට්ඨාස එකතුවී (4) ........................................ සෑදී ඇත. ශ්‍රී ලංකාවේ විශාලම පරිපාලන ඒකකය පළාත වේ. (ල. 04)

03




ඉහත රූප සටහන ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඉහත රූප සටහනින් දැක්වෙන ක්‍රියාවලිය කුමක් ද? (ල.02)


(ii) අංක 1 හා 2 න් දැක්වෙන ක්‍රියාවලිය නම් කරන්න. (ල.04)

(iii) අංක 3 න් දැක්වෙන වලාකුළු නිර්මාණය සිදුවන්නේ කෙසේ ද? (ල.02)

(iv) අංක 4 න් දැක්වෙන ක්‍රියාවලිය නම් කරන්න. (ල.02)

(v) අංක 4 න් දැක්වෙන ක්‍රියාවලිය තුළින් ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න. (ල.01)

04 පහත දැක්වෙන ආගමික සංකේත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.



A B C D

(i) A, B, C, D ආගමික සංකේත මගින් දැක්වෙන ආගම් පිළිවෙලින් ලියන්න. (ල.04)

(ii) එම ආගම් හා සම්බන්ධ උත්සවය බැගින් ලියන්න. (ල.04)

(iii) ඔබ ප්‍රදේශයේ ප්‍රජාවගේ දියුණුව උදෙසා පිහිටුවාගෙන ඇති සමිති සමාගම් 03 ක් නම් කර ඒවායින් ඉටුකෙරෙන කාර්යය බැගින් ලියන්න. (ල.03)

05 ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්ප ඥාණය පදනම්වූ කර්මාන්ත පිළිබඳ දැනුම ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

(i)

| කර්මාන්තය | ප්‍රදේශය | දිස්ත්‍රික්කය | පළාත |
|---|---|---|---|
| වේවැල් භාණ්ඩ | 1. ...................... | 2. ...................... | බස්නාහිර |
| 3. ...................... | අම්බලන්ගොඩ | ගාල්ල | 4. ...................... |
| පැදුරු | 5. ...................... | මහනුවර | 6. ...................... |
| 7. ...................... | මොරටුව | කොළඹ | 8. ...................... |

(ල.08)

(ii) ඔබ ප්‍රදේශයේ පවතින ස්වාභාවික සම්පත් ඇසුරු කරගෙන සිදු කරනු ලබන කර්මාන්ත 03 ක නම් ලියන්න. (ල.03)

06 පහත දැක්වෙන්නේ විවිධ ප්‍රදේශවලට සුවිශේෂී වූ කෘෂිකාර්මික ප්‍රදේශ හා බෝග වර්ග කීපයකි. ඒ ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C



D

(i) ශ්‍රී ලංකාවේ A හා C ප්‍රදේශවල වගා කරන බෝග දෙකක් නම් කරන්න. (ල.04)

(ii) B හා D ප්‍රදේශවල වාසය කරන මිනිසුන්ගේ ජීවනෝපායන් 2 බැගින් දක්වන්න. (ල.04)

(iii) C ප්‍රදේශයේ වාසය කරන ජනයා නියැලෙන කර්මාන්ත දෙකක් දක්වන්න. (ල.03)

07 පහත දක්වා ඇති විවිධ සේවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත දැක්වෙන සේවා ඇසුරින් රජය මැදිහත්වී නොමිලේ ලබාදෙන සේවා 04 ක් ලියන්න. (ල.04)

(ii) රජයේ මැදිහත්වීමෙන් සහනදායී මිලකට ඔබට ලබාදෙන සේවාවන් දෙකක් ලියන්න. (ල.04)

(iii) ඉහත දක්වා ඇති සේවාවන් භුක්ති විඳීමෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 03 ක් ලියන්න. (ල.03)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) බත්කුරා (02) මායිම (03) අධ්‍යාපන කොට්ඨාස (04) කුඩා පරිමාණ කර්මාන්ත
(05) පොළොන්නරුව (06) ✓ (07) × (08) × (09) ✓ (10) ✓ (11) 2
(12) 2 (13) 3 (14) 2 (15) 4 (16) නයිට්‍රජන් (17) ගම්පහ (18) මිලිමීටර්
(19) කපුටා (20) සුළං දිශා දර්ශකය (2 x 20 = ල. 40)

## II කොටස

01 (i) J - ත්‍රිකුණාමලය I - මඩකලපුව (ල.04)
(ii) C - බස්නාහිර පළාත (ල.04)
(iii) G - මාතර K - හම්බන්තොට (ල. 04)
(iv) F අදාල අක්ෂරය ලියා තිබේනම්. (ල.02)
(v) උතුරු පළාත (ල.02)

02 (i) <u>පහළට</u>
(1) උෂ්ණත්වය (3) අනිලමානය
<u>හරහට</u>
(2) උතුර (4) නිරීක්ෂණය (5) සිංහල (6) නයා (7) යල
(ii) 1. නගරයක 2. අංකයක් 3. ප්‍රාදේශීය ලේකම් 4. දිස්ත්‍රික්කය

03 (i) වර්ෂාව ඇතිවන ක්‍රියාවලිය. / ජල චක්‍රය (ල.02)
(ii) 1. වාෂ්පීකරණය 2. උත්ස්වේදනය (ල.04)
(iii) ජලවාෂ්ප ඝනීභවනය වීමෙන් (ල.02)
(iv) වර්ෂාපතනය (ල.02)
(v) ශාක වැඩීම / පසේ වියළි බව අඩුවීම ආදී පිළිතුරු ඇත්නම් (ල.01)

04 (i) A - බෞද්ධ B - හින්දු C - කතෝලික D - ඉස්ලාම් (ල.04)
(ii) A - වෙසක්, පොසොන් ආදී.... B - තෛපොන්ගල්, මහාශිව රාත්‍රිය
C - නත්තල්, මහ සිකුරාදා D - රාමසාන්, හජ්ජි (ල.04)
(iii) අදාල පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ල.03)

05 (i) (1) රදාවඩුන්න (2) ගම්පහ (3) වෙස්මුහුණ (4) දකුණ
(5) දුම්බර (6) මධ්‍යම (7) ලී බඩු (8) බස්නාහිර (ල.08)
(ii) පැඳුරු, වළං, ගඩොල්..... ආදී කර්මාන්ත ලියා ඇත්නම්. (ල.03)

06 (i) A තේ C පොල් (නිවැරදි බෝගවලට ලකුණු ලබාදෙන්න.) (ල.04)
(ii) B කොරටු වගාව / තෙත් කලාපීය එළවළු D හේන් වගාව (ල.04)
(iii) ධීවර කර්මාන්තය / කොහු කර්මාන්තය / සංචාරක කර්මාන්තය / ලුණු කර්මාන්තය ආදී (ල.03)

07 (i) අධ්‍යාපන, සෞඛ්‍ය, ආරක්ෂක, තැපැල් (ල.04)
(ii) ප්‍රවාහනයේදී වාරප්‍රවේශ පත්‍ර නිකුත්කිරීම, රාජ්‍ය ඔසුසල මඟින් සහනදායී මිලට ඖෂධ වර්ග ලබාදීම. (ල.04)
(iii) අදාල පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.03)